AL/2016/46/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

| | | |
|---|---|---|
| හින්දු ශිෂ්ටාචාරය I<br>இந்து நாகரிகம் I<br>Hindu Civilization I | 46 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසු පිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, **එහි අංකය** උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි **කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. ඉන්දු නිම්න ප්‍රදේශයෙන් සොයා ගත් මුද්‍රාවලින් ශිව දෙවි වන්දනාව පැවති බවට හඳුනා ගනු ලැබූයේ
   (1) යෝගී කෙනෙකුගේ රුව යටතේ සතුන් සිටින මුද්‍රාවෙනි.
   (2) කකුල් තුනක බංකුවක් මත කිරි භාජනයක් සහ පෙණය පුප්පාගෙන සිටින නයෙකු සිටින මුද්‍රාවෙනි.
   (3) බිළිඳෙකු උපදවමින් සිටින මුද්‍රාවෙනි.
   (4) පූජා වට්ටි හා සංගීත භාණ්ඩය සහිත මුද්‍රාවෙනි.
   (5) බිලි දීමේ මුද්‍රාවෙනි.

2. ආගමම් විස්තර කරන වත් පිළිවෙත්වලට මග පෙන්වන ග්‍රන්ථ වනුයේ,
   (1) සංහිදෛහල් ය. (2) පත්තදිහල් ය.
   (3) තෝත්තිර මාලෛහල් ය. (4) තන්දිරංගල් ය.
   (5) පවිත්‍ර විදි ය.

3. වෛද කාල දෙවිවරුන්ගෙන් සූර්ය හා සම්බන්ධ ‘සවිදා’ යනුවෙන් හඳුන්වන දෙවියන්ට අදාළ වන්නේ,
   (1) පුරුෂ සූක්තය ය. (2) බ්‍රහ්මචර්ය සූක්තය ය. (3) ගායත්‍රී මන්ත්‍රය ය.
   (4) ආයුෂ්ය සූක්තය ය. (5) පෞෂ්ටිගාණී මන්ත්‍රය ය.

4. සාක්ත ආගමංගල් හා සම්බන්ධ විශේෂ නාමය,
   (1) තන්දිරංගල් ය. (2) සංහිදෛ ය. (3) කිරාණම් ය. (4) පාංජරාත්තිරම් ය. (5) භක්ති සූත්‍රය ය.

5. සංස්කෘත භාෂාවෙන් රචනා වූ රාමයාණයේ කර්තෘවරයා,
   (1) ව්‍යාසර් ය. (2) වාල්මිකී ය. (3) බාරත්තුවාජර් ය. (4) කම්බර් ය. (5) රාමානුජර් ය.

6. ශිව දෙවියන් වස අනුභව කරන ලද භාස්කම හඳුන්වනු ලබන නම කුමක් ද?
   (1) කරෛම්ඩට්ට්‍රන්නල් (2) ආලමර් සෙල්වන් (3) මුක්කට් සෙල්වර්
   (4) තිරිපුරතගනර් (5) ගංගාදරන්

7. ආල්වාර්හල් විසින් වර්ණනා කරන ගීතිකා ගයන ලද දේවාල හඳුන්වන විශේෂ නම කුමක් ද?
   (1) කට්ටුලි කෝයිල්හල් (2) පල්ලිප්පඩයි කෝයිල්හල්
   (3) ඥාලක් කෝයිල්හල් (4) කොගුඩික් කෝයිල්හල්
   (5) මංගලාසනම් ලත් කෝයිල්හල්

8. ශෛව නායන්මාර්ලාගෙන් සගමාර්ගය පිළිපැද දෙවියන් වන්දනා කළේ,
   (1) අප්පූදියඩිහල් ය. (2) සේරමාන් පෙරුමාන් නායනාර් ය. (3) සම්බන්තර් ය.
   (4) මණිවාසහර් ය. (5) සුන්දරර් ය.

9. වීර ශෛව දාර්ශනික ක්‍රමය හැඳින්වෙන්නේ පහත සඳහන් ඒවායින් කුමකින් ද?
   (1) අන්දර්යාමිත්වය (2) අනේගාත්ම වාදය
   (3) සරීරසරීරි සම්බන්ධය (4) ශක්තිවිසිස්ටාත්වෛදය
   (5) ධර්මසූදඥානම්

[දෙවෙනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

10. හින්දු ආගමික ධර්ම පැහැදිලි කරන උසස් ම මානව පරමාර්ථ,
    (1) වත් පිළිවෙත් ය. (2) දන්දීම ය. (3) අධ්‍යාපනය ය.
    (4) භාවනාව ය. (5) ආත්ම නිදහස ය.

11. මුහුණු හයක් ඇති හෙයින් මුරුගන්ට කියැවෙන විශේෂ නම,
    (1) කඩම්බන් ය. (2) කාර්තිගේයන් ය. (3) කන්දන් ය.
    (4) ෂණ්මුගන් ය. (5) කුමරන් ය.

12. ශෛව ආගමික සම්ප්‍රදායේ සරියෛ සේවා කළ නායනාර්තුමා,
    (1) නාවුක්කරසර් ය. (2) ඉලයාන්කුඩිමාර නායනාර් ය. (3) කණ්ණප්පර් ය.
    (4) අප්පූදියඩිහල් ය. (5) තිලගවතියාර් ය.

13. තමිල්නාඩුවේ වෛෂ්ණව භක්ති ව්‍යාපාරයට සම්බන්ධ ව සිටිමින් දෙවියන් පෙම්වතෙකු සේ සලකා ගායනා කරනු ලැබුවේ,
    (1) මංගයර්කරසියාර් විසිනි. (2) තිලගවදියාර් විසිනි.
    (3) ශ්‍රී ආණ්ඩාල් විසිනි. (4) කාරයික්කාල් අම්මයාර් විසිනි.
    (5) සෙම්බියන් මාදේවියාර් විසිනි.

14. තමන් කෝගුලමයේ රාදෛ ලෙසත් විෂ්ණු දෙවියන් කෝගුලමයේ කන්නන් ලෙසත් සිතා දේව ප්‍රේමය හෙළි කළ උතුරු ඉන්දියානු භක්තික කාන්තාව,
    (1) රුක්මණී ය. (2) තුච්බදි ය. (3) සගුන්තලෛ ය. (4) මීරාබායි ය. (5) ජානකී ය.

15. සුවාමි විපුලානන්දර් විසින් රචනා කරන ලද ග්‍රන්ථයක් වන්නේ කුමක් ද?
    (1) කන්දපුරාණ නවනීදම් (2) ශෛව පෝදම්
    (3) ශෛව දූෂණ පරිගාරම් (4) යාල්නූල්
    (5) නට්සින්දනයි

16. චෝල යුගයේ නර්තනය කළ කාන්තාවන්ට දෙන ලද නම්බුනාමය වන්නේ,
    (1) නාට්ටියරත්තිනම් ය. (2) කලාවිත්තගර් ය.
    (3) තලෛක්කෝලි ය. (4) නාට්ටියක් කුරිසිල් ය.
    (5) නඩනමාමනී ය.

17. සංග යුගයේ සංගීත ස්වර ගැයූ අය හඳුන්වනු ලැබූ නම කුමක් ද?
    (1) කුත්තර් (2) පාණර් (3) කලෛඥර් (4) කවි (5) නාදබ්බ්‍රමම්

18. "මාව අසත්‍යයේ සිට සත්‍යයට ගෙන යනු මැනව" යන දාර්ශනික චින්තනය සඳහන් වන උපනිෂද්,
    (1) කඨෝපනිෂද් ය. (2) තෛත්ත්‍රීය උපනිෂද් ය.
    (3) මාණ්ඩූක්‍ය උපනිෂද් ය. (4) බෘහදාරණ්යක උපනිෂද් ය.
    (5) සුවේදාස්වදර උපනිෂද් ය.

19. සංකර වේදාන්තයට කියැවෙන විශේෂ නමක් වන්නේ,
    (1) විශේඩ අත්තුවෛදම් ය. (2) සුත්ත අත්තුවෛදම් ය.
    (3) කේවලාත්තුවෛදම් ය. (4) ශිවාත්තුවෛදම් ය.
    (5) තුවෛදාත්තුවෛදම් ය.

20. බ්‍රහ්මම් යනු ඒකීය ය. එය විවිධ ලෙස බිහි වීම පිළිබඳව සංකරර් පවසන හේතුව,
    (1) අවිත්තෛ ය. (2) සිත ය.
    (3) පංච ඉන්ද්‍රියයන්ගේ ක්‍රියා ය. (4) ආණවම් ය.
    (5) අගංගාරම් ය.

21. ඊශ්වර දෙවියන් හා ප්‍රභංජය අතර පවතින වෙනස්කම හැඳින්වීම සඳහා මත්තුවර් භාවිත කරන නම,
    (1) සීව පරස්පර භේදය ය. (2) සඩ පරස්පර භේදය ය.
    (3) සීවඊශ්වර භේදය ය. (4) සඩඊශ්වර භේදය ය.
    (5) සීවසඩ භේදය ය.

22. "සර්ව බලැති ඊශ්වර වන්නේ මහා විෂ්ණු මූර්ති ය" යන සිද්ධාන්තය පවතින්නේ,
    (1) අත්වෛදම් හි ය. (2) තුවෛදම් හි ය.
    (3) කාබාලිහම් හි ය. (4) පිරදියපිඥ්ඥාන දර්ශනම් හි ය.
    (5) පාසුබදම් හි ය.

[තුන්වෙනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

23. 'සිවඥානපෝදම්' නම් ග්‍රන්ථය සංවිධානය කර ඇති පිළිවෙළ සඳහන් වන කාණ්ඩය කුමක් ද?
(1) තන්තිරවියල්, වික්කිරහවියල්, සාදනවියල්, පසුවියල්
(2) පදි ඉයල්, මුත්ති ඉයල්, ප්‍රමාණවියල්, අරුලියල්
(3) උයිරවයිනිලෛ, අරුළදූනිලෛ, පදිමුදූනිලෛ, ඉරුන්මලනිලෛ
(4) ප්‍රාමණවියල්, ඉලක්කනවියල්, සාදනවියල්, පයනියල්
(5) පසුවියල්, මුත්ති ඉයල්, පයනියල්, අරුලියල්

24. විජයනගර නායක්කර් යුගයේ වේදාන්ත හා සිද්ධාන්ත සමගිය තහවුරු කරන ලද්දේ කවුද?
(1) අරුණගිරිනාදර්
(2) සිවප්‍රකාසර්
(3) තායුමානවර්
(4) විද්‍යාරන්යර්
(5) කච්චියප්පර්

25. ශෛව සිද්ධාන්ත ශාස්ත්‍රවල ග්‍රන්ථ අටක් ම රචනා කළේ,
(1) මෙයිකණ්ඩාර් ය.
(2) උමාපදි සිවාචාරියාර් ය.
(3) අරුණන්දි සිවාචාරියාර් ය.
(4) මනවාසගං කඩන්ද දේවර් ය.
(5) උයියවන්ද දේවර් ය.

26. 'තේවාරම් වේදසාරම්' නම් ග්‍රන්ථය රචනා කළ ශ්‍රී ලාංකික ශෛව සිද්ධාන්ත විද්වතා,
(1) ආරුමුගනාවලර් ය.
(2) අරුණාසල තේසිගර් ය.
(3) කාසිවාසි සෙන්දිනාදයියර් ය.
(4) ඥානප්‍රගාසර් ය.
(5) සිවපාදසුන්දරනාර් ය.

27. 'නූල් මුරෛ තෙරින්දු සීලත්තු ඔලුගු' යනුවෙන් පැවසුවේ,
(1) අරුණගිරිනාදර් ය.
(2) ඖවයාර් ය.
(3) කබිලර් ය.
(4) රාමානුජර් ය.
(5) කුමරගුරුබරර් ය.

28. 'පෙරවරුවේ කරන දෙයට පස්වරුවේ ඵලය ලැබේ" යන ධාර්මික අදහස සඳහන් කරන ග්‍රන්ථය,
(1) ආත්තිසූඩි ය.
(2) නල්වලි ය.
(3) කොන්ඩ්‍රයි වේන්දන් ය.
(4) මූදුරෛ ය.
(5) පරිපාඩල් ය.

29. 'ජය ගන්නේ සත්‍යයයි' යන ප්‍රකාශය සඳහන් වන උපනිෂද්,
(1) කඨෝපනිෂද්
(2) කේන උපනිෂද්
(3) මුණ්ඩක උපනිෂද්
(4) ඡාන්දෝග්‍ය උපනිෂද්
(5) ප්‍රශ්න උපනිෂද්

30. 'පංචශීලය' පිළිබඳව පැහැදිලි කරන ධර්මය කුමක් ද?
(1) ජෛන
(2) ශෛවම්
(3) බෞද්ධ
(4) සාක්තම්
(5) වෛෂණවම්

31. ග්‍රාමීය සම්ප්‍රදාය හා සම්බන්ධ සුදුසු ක්‍රියාවක් ලෙස හඳුනාගනු ලබන්නේ කුමක් ද?
(1) විනෝදාංශ
(2) විහිළු තහළු කිරීම
(3) නායකත්ව ලක්ෂණ
(4) සමාජ යහපත
(5) පූජාවට අවශ්‍ය ද්‍රව්‍ය තබා වන්දනා කිරීම

32. 'මනුස්මිරුදි' නම් ග්‍රන්ථයට විවරණ ග්‍රන්ථයක් කළ විද්වතා
(1) සුවාමි විවේකානන්දර් ය.
(2) මේතාදි ය.
(3) රාජාරාම් මෝහන්රායි ය.
(4) සුවාමි විපුලානන්දර් ය.
(5) කලායෝගි ආනන්ද කුමාරස්වාමි ය.

33. 'රජතුමා නීතිය ක්‍රියාත්මක නොකළොත්, විශාල මත්ස්‍යයා කුඩා මත්ස්‍යයා ගිලිනවා සේ බලවතුන් අහිංසකයන්ට කරදර කරයි' යනුවෙන් සඳහන් කරන සංකල්පය කුමක් ද?
(1) ඉරුවිනෛයොප්පු
(2) කර්ම යෝගය
(3) මත්ස්‍ය නීතිය
(4) වේද නීදි
(5) රජ කිරීමට ඇති අයිතිය

34. 'ස්වධර්මය' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) අන් අයට කරන යුතුකම්
(2) සෑම කෙනෙකු විසින් ම කළ යුතු යුතුකම්
(3) එළදෙනකුට කරන යහපත
(4) කාන්තාවන් සුරැකීම
(5) පරිසරය ආරක්ෂා කිරීම

35. හින්දු භක්තිකයන්ගේ මාසයක මුල් දිනට අදාළ කෑමක් වන්නේ,
(1) පත්තියම් ය.
(2) කැඳ ය.
(3) ආඩික්කුල් ය.
(4) තුවාල සුවවීම සඳහා කන කෑම ය.
(5) අන්නපිරාසනම් ය.



Department of Examinations Sri Lanka

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ ව කිසියම් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් දී ඇත. ඒවායින් මාතෘකාව හා **නොගැළපෙන** වරණය තෝරන්න.

36. **අනුරාධපුර යුගයේ හින්දු ආගමික වර්ධනය**
 (1) ශ්‍රී ලාංකික ඉතිහාසයේ ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ක්‍රි.ව. 10වන සියවස දක්වා වන කාල සීමාව අනුරාධපුර යුගය ලෙස සැලකේ.
 (2) බෞද්ධ ආගමික විශ්වාස සහ හින්දු ආගමික සම්ප්‍රදාය වර්ධනය වූ යුගය වශයෙන් මෙම යුගය විශේෂත්වයක් ගනී.
 (3) තමිල්නාඩුවේ ඇතිවූ දේශපාලනික තත්ත්වය සහ ආගමික ප්‍රතිසංස්කරණ මෙයට වැඩි බලපෑමක් ඇති කළේ නැත.
 (4) මෙම යුගයේ හින්දු දෙවිවරු පිළිබඳ සාක්ෂි ලැබිණි.
 (5) ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙම යුගයේ දී බෞද්ධ ධර්මය රාජ්‍ය අනුග්‍රහයෙන් වර්ධන වීමට පටන් ගත්තේ ය.

37. **හින්දු කලා මූලධර්ම**
 (1) කලාවන් හින්දු සංස්කෘතියේ කොටසකි.
 (2) ගෘහ නිර්මාණය, පිළිම කලාව, සිතුවම් ආදිය දෘශ්‍යමාන කලා වේ.
 (3) සංගීතය, නර්තනය යනාදිය වේදිකාගත කෙරෙන කලා වේ.
 (4) කලා අත්දැකීම් හා ආධ්‍යාත්මික අත්දැකීම් විවිධාකාර වූ අත්දැකීම්වල ප්‍රතිඵල වේ.
 (5) එයට ම ආවේණික වූ ක්‍රමවේද හා මූලධර්ම තිබීම එහි විශේෂත්වයකි.

38. **මෙයිකණ්ඩ ශාස්ත්‍රවලින් එකක් වූ සිවඥානසිත්තියාර්**
 (1) 'සිවඥානසිත්තියාර්' යනු 'සිවඥානපෝදම්' ග්‍රන්ථය පදනම් කරගෙන ලියවුණු ග්‍රන්ථයෙකි.
 (2) අරුණන්දි සිවාචාරියාර් විසින් රචනා කරන ලද්දකි.
 (3) මෙම ග්‍රන්ථයේ 'පරපක්කම්' සහ 'සුපක්කම්' යනුවෙන් කොටස් දෙකක් ඇත.
 (4) මෙයිකණ්ඩ ශාස්ත්‍ර දහහතරෙන් ඉතා කෙටි ම ග්‍රන්ථය මෙය වේ.
 (5) 'ශිව දෙවියන්ට ඉහළ දෙවියකු නැත, සිවඥානසිත්තියට ඉහළ ග්‍රන්ථයක් ද නැත.' යනුවෙන් මෙම ග්‍රන්ථය අගය කරනු ලැබේ.

39. **නිරුනෙල්වේලියේ ඥානප්‍රකාශ මුනිවර්**
 (1) ශ්‍රී ලංකාවේ බිහි වූ ශෛව ආගමික විද්වතුන්ගෙන් කෙනෙකි.
 (2) වේදාරණ්‍ය නම් ස්ථානයේ නවාතැන් ගෙන විවිධ ආගමික කටයුතුවල නියැලිණි.
 (3) දෙමළ හා සංස්කෘත භාෂාවේ ශෛව සිද්ධාන්ත පිළිබඳ ග්‍රන්ථ රැසක් රචනා කර ඇත.
 (4) මොහු රචනා කළ 'සිවයෝගරත්තිනම්' නම් වූ ග්‍රන්ථය දෙමළ ගීතිකාවලින් සමන්විත ය.
 (5) පෘතුගීසීන්ගේ නීතිවලට එකඟ නොවී, ගව හිංසනයට බියෙන් යාපනය අත්හැර තමිල්නාඩුවට ගියේ ය.

40. **හින්දු විද්‍යා**
 (1) දැනුම සහ විධිමත් පර්යේෂණ මගින් සත්‍යතාව සාධනය කිරීම යනුවෙන් නිර්වචනය කෙරේ.
 (2) හින්දු විද්‍යාත්මක ක්ෂේත්‍ර සියල්ල හින්දු භක්තිකයන්ගේ ජීවිතය හා සම්බන්ධ වී ඇත.
 (3) හින්දු විද්‍යාත්මක ක්ෂේත්‍රය තුළ ගණිතය වැදගත් වේ.
 (4) ගුප්ත යුගයේ බිහිවූ 'ආරියබට්ටීයම්', 'පංචසිත්තාන්දිකා' යන ග්‍රන්ථවල ගණිතය පිළිබඳ අදහස් ඇතුළත් ය.
 (5) දෙමළ ග්‍රන්ථ අතුරෙන් තිරුමුරෛවල ගණිත අදහස් ඇත්තේ ඉතා ම සුලු වශයෙනි.

- පහත දී ඇති වචන අතුරෙන් දෙකක් විශේෂ කරුණක් මත එකිනෙක අතර සම්බන්ධතාවක් දක්වයි. එම සම්බන්ධතාව පදනම් කරගෙන, අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| A<br>පස්වන වේදය | B<br>කීර්තනෛහල් | C<br>සමාජ පිළිවෙළ | D<br>අනුන් පහත් කොට සැලකීම නුසුදුසු ය. | E<br>සගුණ බ්‍රහ්ම |
| F<br>විසි කිරීම නුසුදුසු ය. | G<br>නිර්ගුණ බ්‍රහ්ම | H<br>හින්දු විශ්වකෝෂ | I<br>සාධාරණත්වය ස්ථාපිත කිරීම | J<br>සංගීත කුලුනු |

41. මහාභාරතම් පිළිබඳ විශේෂතා සඳහන් කරන යුගලය කුමක් ද?
 (1) AG (2) AH (3) CF (4) DJ (5) EI

42. නායක්කර් යුගයේ හඳුන්වා දෙනු ලැබූ සංගීත ක්ෂේත්‍ර ආශ්‍රිත කලා ලක්ෂණ හඳුන්වනු ලබන යුගලය කුමක් ද?
 (1) AI (2) BH (3) BJ (4) CJ (5) DG

43. සංකරර් සඳහන් කරන බ්‍රහ්මහි ස්වරූප දෙක සඳහන් වන යුගලය කුමක් ද?
 (1) AF (2) BI (3) BJ (4) DJ (5) EG

44. ධර්ම ශාස්ත්‍රවලට අනුව දණ්ඩ නීතිය මගින් ආරක්ෂා වන ක්ෂේත්‍ර දෙක සඳහන් වන යුගලය කුමක් ද?
 (1) AH (2) AJ (3) BH (4) CI (5) EH

45. තෛත්‍රිය උපනිෂද්හි ජීවිතය ආරක්ෂා කරන හසංයා පිළිබඳ අදහස් සඳහන් වන යුගලය කුමක් ද?
 (1) AG (2) BH (3) DF (4) DJ (5) EI



Department of Examinations Sri Lanka

● අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශ කියවා, එයට සුදුසු ඒවා I, II, III, IV යන තීරුවලින් තෝරන්න.

| I | II | III | IV |
|---|---|---|---|
| A<br>විනය මාර්ගය | F<br>සත්‍ය කතා කිරීම | K<br>සාරිත්තිරම් | P<br>දුප්පත් කාලයේ කන්ජි පිරිනැමීම |
| B<br>සංගීත ගුණාංග සහිත ඒවා | G<br>ඉන්දියාවේ නව යුගයේ පියා | L<br>විශ්ලේෂණවාදයේ පුරෝගාමියා | Q<br>ආධ්‍යාත්මික අධ්‍යාපනය |
| C<br>ශෛව ආගමික දේශන පැවැත්වීම | H<br>ව්‍යවහාරම් | M<br>දේවාල පුනරුත්ථාපනය | R<br>රාජසාසනම් |
| D<br>ධර්මය | I<br>දෙවියන් සතුටට පත් කරන දේවල් | N<br>අඳුරු භක්තිය | S<br>වේදාන්ත මතයට වැදගත්කමක් දීම |
| E<br>බ්‍රහ්ම සූත්‍රයට විවරණ ලියූ අය | J<br>පුරාණ පඩනම් | O<br>දේවාලවල දෙවියන්ගේ පැවැත්ම තහවුරු කරන ඒවා | T<br>දේව කැමැත්ත ඇති කළ හැකි දේවල් |

46. නායන්මාර්ලාගේ ගීතිකාවල දේවත්ව වැදගත්කම සඳහන් කරන කාණ්ඩය,
(1) AFLT (2) AILR (3) BGLS (4) BIOT (5) EFLT

47. හින්දු සමාජය ප්‍රතිසංස්කරණය කළ රාජාරාම් මෝහන්රායි හා සම්බන්ධ කාණ්ඩය,
(1) AILT (2) BFOP (3) BGOR (4) CILR (5) EGLS

48. හින්දු දේශපාලනයේ රාජ්‍ය නීතියට ප්‍රධාන ඒවා ලෙස සඳහන් වන කරුණු ඇතුළත් කාණ්ඩය,
(1) AGLT (2) DHKR (3) DHLT (4) DILR (5) DIOT

49. ශ්‍රීලශ්‍රී ආරුමුගනාවලර්තුමා ශෛව ආගමික වර්ධනය සඳහා කළ සේවා හා සම්බන්ධ කාණ්ඩය,
(1) BGLR (2) CHLR (3) CINR (4) CJMP (5) EGOR

50. හින්දු ගුරුකුල අධ්‍යාපනයේ උසස් ම අරමුණු සඳහන් වන කාණ්ඩය,
(1) AFNQ (2) CILT (3) DILR (4) EHNT (5) EJLT

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2016 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2016 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2016

හින්දු ශිෂ්ටාචාරය II
இந்து நாகரிகம் II
Hindu Civilization II

46 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**උපදෙස් :**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. "හින්දු සංස්කෘතිය වර්ධනය සඳහා වේද සුවිශේෂ දායකත්වයක් ලබා දී ඇත." මෙම ප්‍රකාශය පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
   (අ) වේද ව්‍යුහය
   (ආ) වේද පැහැදිලි කරන ප්‍රධාන දෙවිවරු පිළිබඳ විස්තර
   (ඉ) ආගමික වන්දනාව
   (ඊ) හින්දු ධර්මයේ වේදවල වැදගත්කම

2. තමිල්නාඩුවේ පල්ලව යුගයේ ශෛව ධර්මය වර්ධනය වූ ආකාරය පහත මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.
   (අ) දේශපාලනමය හා සමාජ තත්ත්වය
   (ආ) නායන්මාර්ලාගේ සේවා
   (ඉ) දේවාල වර්ධනය

3. "මිනිස් වර්ගයාගේ වර්ධනය සඳහා රාමක්‍රිෂ්ණ මිෂනයේ සේවා ඉතා උසස් ය." මෙම ප්‍රකාශය පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
   (අ) රාමක්‍රිෂ්ණර්ගේ දේශන
   (ආ) ස්වාමි විවේකානන්දර් සහ රාමක්‍රිෂ්ණ මිෂනය
   (ඉ) ආගමික හා සමාජ සේවා

## II කොටස

4. හින්දු සංස්කෘතික වර්ධනයෙහිලා දේවාල වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න.

5. හින්දු ලලිත කලාවලින් පිළිම කලාවේ වැදගත්කම දක්වා, එහි විශේෂත්වය ශිව පිළිමයක් හා සම්බන්ධ කර විස්තර කරන්න.

6. රාමනුජ වේදාන්ත සංකල්පයේ විශේෂතා පහත සඳහන් මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.
   (අ) රාමනුජර්ගේ දාර්ශනික සංකල්පය බිහි වීමට උපකාරී වූ ග්‍රන්ථ
   (ආ) 'පරම්පොරුල්' පිළිබඳ සංකල්පය
   (ඉ) ආත්මය හා 'පරම්පොරුල්' අතර සම්බන්ධතාව

7. ශෛව සිද්ධාන්තයේ ලොව බිහිවීම පිළිබඳව පැහැදිලි කෙරෙන ආකාරය විස්තර කරන්න.

8. පහත සඳහන් ඒවායින් **හතරකට** කෙටි සටහන් ලියන්න.
   (අ) හින්දු ධර්මයේ 'පුරාණංගල්'
   (ආ) තිරුකේදීෂ්වරම්
   (ඉ) භගවත් ගීතාව
   (ඊ) අරුණගිරිනාදර්
   (උ) ආශ්‍රම ධර්ම
   (ඌ) හින්දු සමාජයේ ජ්‍යොතිෂ්‍යය

* * *

Department of Examinations Sri Lanka